# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2050/38 – 2017 දෙසැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා – 2017.12.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනත**
9 වැනි වගන්තිය යටතේ කෙරෙන නියමය

සිවිල් ගුවන් සේවා විෂය භාර අමාත්‍යවරයා වන නිමල් සිරිපාල ද සිල්වා වන මා විසින් 2002 අංක 34 දරන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරී පනතේ 9 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල අනුව මෙහි පහත උපලේඛනය යටතේ දක්වා ඇති උක්ත පනතේ දෙවන උපලේඛනයේ ගගන යාත්‍රාංගන යටතේ නිශ්චය කොට ඇති පහත නම් සඳහන් ගුවන් තොටුපල සහ උක්ත පනතේ තුන්වන උපලේඛනයේ නිශ්චය කොට ඇති ගගන නාවික පහසුකම් සහ ඒ ගගන යාත්‍රාංගන වලට ආබද්ධ ඉඩම් ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය වෙත වහාම ක්‍රියාත්මක වන පරිදි පවරා නතු කර දෙන බව මෙයින් දැනුම් දෙමි.

නිමල් සිරිපාල ද සිල්වා (පා.ම),
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍ය.

2017 දෙසැම්බර් මස 18 වැනි දින,
සෙත්සිරිපාය අදියර 11,
බත්තරමුල්ල.
ප්‍රවාහන හා සිවිල් ගුවන්සේවා අමාත්‍යාංශයේදී ය.

1A – G 26838 – 08 (2017/12)

*සැ.යු.– මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

***ගගන යාත්‍රාංගන***

***(දෙවන උපලේඛනයේ නිශ්චය කොට ඇති)***

1. කටුනායක ගුවන් තොටුපල
2. රත්මලාන ගුවන් තොටුපල

*ගගන නාවික පහසුකම් සහ ගගන යාත්‍රාංගන වලට ආබද්ධ ඉඩම්*

*(තුන්වන උපලේඛනයේ නිශ්චය කොට ඇති)*

1. රත්මලාන, කඳවල පාරේ පිහිටි සිවිල් ගුවන් සේවා පුහුණු මධ්‍යස්ථානය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
2. රත්මලාන, අත්තිඩියේ පිහිටි ගගන නාවික සන්නිවේදන සම්ප්‍රේෂණාගාරය, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
3. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සඳහා ගම්පහ, මඩම්පැල්ලේ පිහිටුවා ඇති, ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම
4. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපලෙහි ධාවන පථය සඳහා ගම්පහ, පමුණුගම, කැපුන්ගොඩ පිහිටුවා ඇති, ගුවන් විදුලි සංතරණ උපකාරක, එහි ගොඩනැගිලි සහ ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.
5. පිදුරුතලාගල කන්දේ පිහිටුවා ඇති රේඩාර් ස්ථානය, එහි ගොඩනැගිලි හා ඉදිකිරීම් සහ ඊට ආබද්ධ ඉඩම.
6. ගුවන් සේවා කාර්ය මණ්ඩලය සඳහා නිවාඩු නිකේතනය ඉදිකර තිබෙන නුවරඑළිය දිස්ත්‍රික්කයේ පිදුරුතලාගල පිහිටි ඉඩම, එහි ඇති හෝ ඊට ආබද්ධ කවර හෝ ඉදි කිරීම් ද ඇතුළුව
7. අනුරාධපුර දිස්ත්‍රික්කයේ නැගෙනහිර නුවරගම් පලාත, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අංක 249 ''ආ'' පියවර කොටස ග්‍රාම නිලධාරී කොට්ඨාසය සීමාවට අයත් අනුරාධපුර නව නගරයේ කැබලි අංක 976, දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.125 ක් පමණ වූ ඉඩම් කොටස

01-181

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.